2024.01.23

**පාර්ලිමේන්තුවේ කථානායක**
**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**

**<u>මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පතට කාරක සභා අවස්ථාවේදී ගෙනඒනු ලබන සංශෝධන</u>**

ස්ථාවර නියෝග 57 හා 66 ප්‍රකාර "මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත" එහි කාරක සභා අවස්ථාවේදී සංශෝධනය කරනු පිණිස පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කෙරේ.

**02** පිටුව
**03** වගන්තිය - **02 සිට 16 දක්වා පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කොට පහත සඳහන් පේළි ආදේශ කරන්න**

අ) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා තහනම් ප්‍රකාශ සන්නිවේදනය කිරීමෙන් සිදුවන හානියෙන් පුද්ගලයන් ආරක්ෂා කිරීම;

ආ) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා අධිකරණයට අපහාස වන්නාවූ හෝ අධිකරණයේ බලය සහ අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාමට අගතිගාමී වන්නාවූ ප්‍රකාශ සන්නිවේදනය කිරීමෙන් ආරක්ෂා වීම තහවුරු කිරීම;

**03** පිටුව
**05** වගන්තිය **07 සිට 12 දක්වා පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කොට පහත සඳහන් පේළි ආදේශ කරන්න**

1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නම්කරන ලදුව ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන, තොරතුරු තාක්ෂණය, නීතිය, පාලනය, සමාජ සේවා, පුවත්පත් කලාව, විද්‍යාව සහ තාක්ෂණය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍ර එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් සුදුසුකම් සහ පළපුරුද්ද සහිත, සාමාජිකයන් පස්දෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත විය යුතුය
2) 6වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කිරීම් සිදුකරනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සභාව විසින් (1) උප වගන්තිය යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත්කරනු පිණිස පුද්ගලයන් පස් දෙනෙකුගේ නම් යෝජනා කළ යුතුය.
3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නාම යෝජනා ලැබීමෙන් දින දහ හතරක කාලයක් ඇතුළත ජනාධිපතිවරයා විසින් (2) උප වගන්තිය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නම්කරන ලද පුද්ගලයන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත්කළ යුතුය.
4) (3) උප වගන්තිය තුළ දක්වා ඇති දින දහහතරක කාල පරිච්ඡේදය ඇතුළත අවශ්‍ය පත්කිරීම් සිදුකිරීමට ජනාධිපතිවරයා අසමත් වුවහොත්, එම කාල පරිච්ඡේදය ඉක්ම ගිය දින සිට ක්‍රියාත්මකවන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නම්කරන ලද පුද්ගලයන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත්කරනු ලැබ ඇත්තා සේ සැලකිය යුතුය.

**11** පිටුව
**15** වගන්තිය - **20 සිට 30 දක්වා පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කරන්න**

**13** පිටුව
**19** වගන්තිය - **14 සිට 29 දක්වා පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කරන්න**

**28** පිටුව
**31** වගන්තිය - **16 සිට 28 දක්වා පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කොට පහත සඳහන් පේළි ආදේශ කරන්න:-**

උප ශීර්ෂය– "මැදිහත්කරු වගකීමෙන් මුක්තිය"

(1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණද, (2)වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පහත සඳහන් සේවාවන් සැපයීමේ නිරතව සිටින යම් තැනැත්තකු, ඒ තැනැත්තා හිමිකාරිත්වය දරන, මෙහෙයවන හෝ පාලනය කරනු ලබන මාර්ගගත ස්ථානයකින් සන්නිවේදනය කරන ලද තහනම් ප්‍රකාශයක් සංසරණය වීම සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ වරදක් වන යම් තහනම් ප්‍රකාශයක් අඩංගු වන සන්නිවේදන සබැඳියක් ඒ මාර්ගගත ස්ථානය හරහා අවසාන පරිශීලකයන් වෙත ලබා දීම සම්බන්ධයෙන් හෝ යම් අවිශ්වසනීය මාර්ගගත ගිණුමක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ලබාදෙන ලද යම් නියමයක් හෝ යම් තහනම් ප්‍රකාශයක් හෝ වෙනයම් සන්නිවේදනයක් මගින් යම් තැනැත්තකුට සිදුවූ යම් අයුතු හානියක් සඳහා ගෙවිය යුතු වන්දියක් සම්බන්ධයෙන් හෝ කිසිදු සිවිල් හෝ අපරාධමය වගකීමකට යටත් නොවිය යුතුය.

(අ) අන්තර්ජාල අතරමැදි සේවාවක්;

(ආ) අන්තර්ජාල සේවා සම්පාදකයෙක්;

(ඇ) ඩිජිටල් දැන්වීම්කරණ අතරමැදියෙකු; හෝ

(ඈ) පරිගණක සම්පත් සේවාවක්.

(2) (1)වන හා (2)වන උප වගන්ති යටතේ ලබාදෙනු ලබන වගකීමෙන් මුක්තිය, ඒ තැනැත්තා විසින් -

අ) සන්නිවේදනය නිර්මාණය කොට ආරම්භ කොට ඇත්තේ නම්; හෝ

ආ) මෙම පනතේ 36 වගන්තියට අනුව සකස් කරන ලදුව පනතේ 53වන වගන්තිය යටතේ එන නියමයන් වශයෙන් සම්මත කරන ලද පිළිවෙත් සංග්‍රහයකට අනුගත නොවන්නේ නම්

අදාළ නොවිය යුතුය.

**29** පිටුව
**31** වගන්තිය - **01 සිට 14 දක්වා පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කරන්න**

**40** පිටුව
**36** වගන්තිය - **2 සහ 3 පේළි ඉවත් කොට පහත සඳහන් පේළිය ආදේශ කරන්න: -**

"කර්මාන්ත පිළිවෙත් සංග්‍රහය"

**40 පිටුව**
**36 වගන්තිය** - **4 සිට 28 දක්වා පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කොට පහත සඳහන් පේළි ආදේශ කරන්න:-**

පැති සටහන- ''කර්මාන්ත පිළිවෙත් සංග්‍රහය''

1. පහත සඳහන් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් කටයුතු කරනු පිණිස කොමිෂන් සභාව විසින් ''අන්තර්ජාල අතරමැදියන්'' හා ''අන්තර්ජාල සේවා සම්පාදකයන්'' වෙත අදාළ වන්නාවූ පිළිවෙත් සංග්‍රහයන් එකක් හෝ වැඩි ගණනක් නිකුත් කරනු ඇත:

අ) වෛරී ප්‍රකාශ, ප්‍රචණ්ඩත්වය අවුලුවාලීම, සාවද්‍ය තොරතුරු, විකෘති තොරතුරු, සයිබර් බලපෑම් සහ හිරිහැර කිරීම් සහ මාර්ගගත ලිංගික සූරාකෑම සහ අපයෝජනයද ඇතුළත් හානිකර මාර්ගගත අන්තර්ගතයන් හා චර්යාවන් ආමන්ත්‍රණය;

ආ) සම්බන්ධීකෘත අවිශ්වසනීය හැසිරීම් සහ වෙනයම් මාර්ගගත ගිණුම් අනිසි ලෙස භාවිතා කිරීමක් හඳුනා ගැනීම, පාලනය කිරීම සහ එවැනි තත්ත්වයන්ගෙන් ආරක්ෂා කිරීම;

ඇ) හානිකර අන්තර්ගතයන් සීමා කිරීමට ගන්නා ලද ප්‍රායෝගික ක්‍රියාමාර්ගවලට අදාළ මෙහෙයුම් ප්‍රමිතීන් සහ විනිවිදභාවය පිළිබඳ වාර්තා කිරීම් සැකසීම.

ඈ) නිර්දිෂ්ට ඩිජිටල් වෙළඳ ප්‍රචාරණ අතරමැදියන් හෝ නිර්දිෂ්ට ආකාරයේ ඩිජිටල් ප්‍රචාරණ අතරමැදියන්; සහ

ඉ) ශ්‍රී ලංකාව තුළ සන්නිවේදනය කරනු ලබන, දේශපාලන අරමුණක් සඳහා යොමු වූ ඕනෑම ගාස්තු ගෙවූ අන්තර්ගතයක් සම්බන්ධයෙන් අනුග්‍රාහකයා සහ අනෙකුත් තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වූ නිර්දිෂ්ට අන්තර්ජාල අතරමැදියන්.

ඊ) 11 වගන්තියේ (ඇ) ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද යම් නියමයක් හා අනුගත විය යුතුවන කාල පරිච්ඡේදය

(3) මෙම වගන්තියේ (1) උපවගන්තිය තුළ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු පිණිස 1 වගන්තියේ (2) උපවගන්තිය තුළ නිර්දිෂ්ට ක්‍රියාත්මක කිරීමේ කාලයේ සිට මාස නවයක් ඇතුළත ස්වේච්ඡා පදනමකින් (මෙහි මින්මතු 'පිළිවෙත් සංග්‍රහය' ලෙස හැඳින්වෙන) කර්මාන්තමය පිළිවෙත් සංග්‍රහයක් සම්පාදනය කරනු පිණිස 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්' වෙත අවස්ථාවක් ලබාදෙමින් කොමිෂන් සභාව විසින් (ගැසට් පත්‍රයක පළකරනු ලබන නියෝගයක් මගින්) නිවේදනයක් නිකුත් කළ යුතුය.

(4) (2) උපවගන්තිය තුළ නිර්දිෂ්ට ක්‍රියාත්මක කිරීමේ කාලයේ සිට මාස නවයක් ඇතුළත ස්වේච්ඡා පදනමකින් පිළිවෙත් සංග්‍රහයක් සම්පාදනය කිරීමට 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්' හට නොහැකි වුවහොත්, හෝ 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්' විසින් එය ඒකාබද්ධව සම්පාදනය කිරීමේ අභිලාශය කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබ කොමිෂන් සභාවද සමගින් පිළිවෙත් සංග්‍රහයකට එකඟ වුවහොත්, එවිට කොමිෂන් සභාව විසින් මෙම වගන්තියේ (1) උපවගන්තිය තුළ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු පිණිස පිළිවෙත් සංග්‍රහයක් සම්පාදනය කිරීමට පියවර ගත යුතුය.

(5) මෙම වගන්තියේ (3) උපවගන්තිය අනුව කොමිෂන් සභාව විසින් පියවර ගැනීමෙන් අනතුරුව විද්‍යුත් ස්වරූපයෙන් පිළිවෙත් සංග්‍රහයක් පළකොට මාස තුනකට නොඅඩු කාල පරිච්ඡේදයක් ඇතුළත 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්' වෙතින් අදහස්, නිරීක්ෂණ හා නිර්දේශද ලබාගෙන පිළිවෙත් සංග්‍රහය කෙටුම්පත ක්‍රියාත්මක කරනු පිණිස 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා

සම්පාදකයන්' සමග එකඟතාවයකට හා සම්මුතියකට එළැඹීමට පියවර ගැනීම කොමිෂන් සභාවේ කාර්ය වන්නේය.

(6) මෙම වගන්තියේ (4) උපවගන්තියට අනුගතව කොමිෂන් සභාව විසින් පිළිවෙත් සංග්‍රහ කෙටුම්පත සඳහා 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්' වෙතින් අදහස්, නිරීක්ෂණ හා නිර්දේශද ලබාගෙන ඔවුන්ගේ එකඟතාවය හා සම්මුතියද ලබාගත් පසු කොමිෂන් සභාව විසින් 53 වගන්තිය ප්‍රකාර පිළිවෙත් සංග්‍රහය නිකුත් කිරීමට පූර්වයෙන් පිළිවෙත් සංග්‍රහය කෙටුම්පත සම්බන්ධයෙන් මහජන අදහස් විමසීම් සිදු කිරීමට පියවර ගත යුතුය.

(7) 53 වගන්තිය හා අනුගතව පිළිවෙත් සංග්‍රහය නියමයක් ලෙස ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව, මෙම වගන්තිය හා අනුගතව සම්පාදිත පිළිවෙත් සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීමට 'අන්තර්ජාල අතරමැදියන්' සහ 'අන්තර්ජාල සේවා සම්පාදකයන්'බැඳී සිටී.

**41** පිටුව
36 වගන්තිය - **01 සිට 30 දක්වා පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කරන්න**

**42** පිටුව
36 වගන්තිය - **01 සිට 33 දක්වා පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කරන්න**

**43** පිටුව
36 වගන්තිය - **01 සිට 34 දක්වා පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කරන්න**

**44** පිටුව
36 වගන්තිය - **01 සිට 04 දක්වා පේළි (එම පේළි දෙකද ඇතුළත්ව) ඉවත් කරන්න**

**චන්දිම වීරක්කොඩි**
පාර්ලිමේන්තු මන්ත්‍රී